# තනි පද-12

වචන කිහිපයක් වචනුවට වයදිය හැකි තනි වචන තනි පද නම් වේ .

උදා :- අනුන් ගැන සිතන්නා - පරාර්ථකාමී

| | | | |
|---|---|---|---|
| 221) | දහවලට හැසිරෙන | - | දිවාචර |
| 222) | මුහුණ බලන කණ්ණාඩිය | - | කැඩපත |
| 223) | ඉතා වේගයෙන් යන | - | අධිවේගී |
| 224) | හිරුගෙන් ලැබෙන එළිය | - | හිරුඑළිය |
| 225) | කටින් ම කඩා ගෙන කෑම | - | උලා කෑම |
| 226) | හොඳ ම මිතුරා | - | අඹ යාළුවා |
| 227) | නිවසට පිටතින් පැමිණි කෙනා | - | ආගන්තුකයා/ අමුත්තා |
| 228) | අයහපත් ගති ඇති මිනිසුන් | - | දුදනන් |
| 229) | යහපත් ගති ඇති මිනිසුන් | - | සුදනන් |
| 230) | කිසිම ලෙඩක් නැති | - | නිරෝගී |
| 231) | වැඩපල කිරීමට අකැමැති | - | කම්මැලි |
| 232) | උවමනා දෙයට පවා වියදම් නොකරන | - | මසුරු/ ලෝභ |
| 233) | අසුපිට ගමන් කරන්නා | - | අසරුවා/ අශ්වාරෝහකයා |
| 234) | ඇතුපිට ගමන් කරන්නා | - | ඇතරුවා |
| 235) | අසනීපයකට බේත් ගැනීමට යන තැන | - | රෝහල |
| 236) | රජතුමා වාසය කරන නිවාසය | - | මාළිගය |
| 237) | ලංකාවේ වාසය කරන්නෝ | - | ලාංකිකයෝ |
| 238) | ජලයෙහි හැසිරෙන | - | ජලචර |
| 239) | අනුන්ට කරන උදවු | - | පරෝපකාරය |
| 240) | කිසි උඩඟු කමක් නැති | - | නිහතමානී |